**කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය**

**ගැබිණි හා කිරිදෙන මව්වරුන්ට රු.45,000/-ක පෝෂණීය දීමනාවක් ලබා දීමේ වැඩසටහන**

**උපදෙස් පත්‍රිකාව**

☞ ඔබ සහභාගි වන සායන මධ්‍යස්ථානයෙන්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලද අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර, ඔබ ස්ථිරවම පදිංචි වසමේ ග්‍රාම නිලධාරීගෙන් පදිංචිය සහතික කර පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ නිර්දේශය සහ දැනට සහභාගි වන මාතෘ සායනයේ සායනභාර වෛද්‍ය නිලධාරිගේ නිර්දේශය සහිතව, **ගැබ්ගෙන මාස 03ක් ඉක්මවීමට පෙර** ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මුල් ළමා විය සංවර්ධන නිලධාරි හෝ මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන නිලධාරියාට භාර දෙන්න.

☞ ඔබ විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය භාරදිය යුත්තේ ඔබ සහභාගි වන මාතෘ සායනය අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට වේ.

☞ ඔබගේ අයදුම්පත්‍රය සමඟ ගැබිණි සටහන්පතේ පිටපතක් අමුණා තබන්න.

☞ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් වවුචර්පත් ලද පසු මෙම වැඩසටහනට අදාලව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වෙළඳ ආයතන වෙතින් අදාල මාසයේ වවුචර්පත්‍රයට හිමි ආහාර ද්‍රව්‍ය ලබා ගත හැකිය. එක් වවුචර්පත්‍රයක වටිනාකම රු.4,500/-ක් වන අතර එක් ආයතනයකින් එකවර රු.4,500/-ට සරිලන නිර්දේශිත ද්‍රව්‍ය ලබාගත යුතුය.

☞ ආහාර ද්‍රව්‍ය ලබා ගැනීමේදී **නිර්දේශිත ආහාර ද්‍රව්‍ය පමණක් ලබාගත යුතුය.** එම නිර්දේශිත ආහාර ද්‍රව්‍යවලින් ආහාර වර්ග අවම වශයෙන් 05ක්වත් ලබාගත යුතු අතර ආහාර කාණ්ඩ කිහිපයක් නියෝජනය වන පරිදි ආහාර වර්ග තෝරාගත යුතුය.

☞ නිර්දේශිත ආහාර ද්‍රව්‍ය කාණ්ඩ හැර වෙනත් ද්‍රව්‍ය කාණ්ඩයන් හෝ මුදල් ගැනීමක් සිදු වූ වහාම ඔබට හිමි සියලු වවුචර්පත්‍ර අවලංගු කිරීමට සිදුවනු ඇත.

☞ ඔබ පසුකරන්නේ සුවිශේෂ කාල පරිච්ඡේදයක් බැවින් සෑම විටම වස විසෙන් තොර, ස්වාභාවික පෝෂණ ද්‍රව්‍ය ලබාගැනීම හා යහපත් මානසික තත්ත්වයක් පවත්වා ගැනීම මගින් යහපත් දරුවකු බිහිකිරීමේ ගෞරවය ඔබට හිමිවනු ඇත.